# දේශීය වෛද්‍ය ආයතනයේ ආරක්ෂාව තහවුරු කිරීම.

වර්තමාන ආරක්ෂක තත්ත්වය පිළිබඳව, සරසවි සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයෙහි පෞද්ගලික ආරක්ෂාව සහ දේපළ ආරක්ෂා කිරීම සඳහා උපරිම උපදෙස් ලබා දීම.

සිසුන් සඳහා

1. කොළඹ විශ්ව විද්‍යාලයේ ,දේශීය වෛද්‍ය විද්‍යායතනයේ සියලුම අධ්‍යන කටයුතු (ආයුර්වේද) මැයි මස 27 දින සිට ආරම්භ කිරීමට නියමිතයි.
2. නේවාසිකාගර මැයි මස 23 දින උදෑසන 6 සිට විවෘත පවතී.
3. සියළුම පුද්ගලයින් (අධ්‍යන හා අනඅධ්‍යන කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන් හා අමුත්තන්) ආයතන පරිශ්‍රයට ඇතුළුවීමට අවසර දෙනු ලබන්නේ ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමන් පසුව පැමිණීමට හේතුව, භෞතික පරීක්ෂාව සහ සියළුම බෑග්, ගමන් මලු සහ ඇසුරුම් හෝ අනිකුත් දේපල පරීක්ෂණයකට යටත් වූ පසුව පමණි.
4. සයිකල්, යතුරුපැදි, ස්කූටර් සහ ත්‍රී රෝද රථ ඇතුළුව සියලු වර්ගවල වාහන දේශීය වෛද්‍ය විද්‍යායතනයට හා නේවාසික පරිශ්‍රයට ඇතුළුවීමට පෙර සම්පූර්ණ පරීක්ෂාවකට යටත් විය යුතුය.
5. වාහනයේ ගමන් බලපත්‍රය සිය පෞද්ගලික වාහනවල ප්‍රදර්ශනය කිරීමට සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
6. කිසිදු පුද්ගලයකුට මුහුණ ආවරණයක් සහිත ව ආයතනයට සහ නේවාසික පරිශ්‍රයට ඇතුළුවීමට හෝ රැඳී සිටීමට අවසර නැත.
7. මුහුණ ආවරණය කිරීම හැර, හිස, කන් සහ ගෙල ආවරණ ඇතුළත් වන ඇඳුම් ආයිත්තම් සෙසු පුද්ගලයාගේ පෞද්ගලික තීරණයක් ලෙස සැලකිය යුතුය.
8. ශිෂ්‍යය හැඳුනුම්පතක්, ඔවුන් ආයතනයේ සහ නේවාසිකාගාර වල සිටින විට ඔවුන් සතු විය යුතුය.
9. ශිෂ්‍යයන්ගේ හිතවතුන් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට නේවාසිකාගාර වලට යාමට අවසර නොමැත.
10. දේශන ශාලා, පරීක්ෂණ ශාලා, රසායනාගාර හා පුස්තකාල තුලට සියළුම බෑග්, ගමන් මලු සහ ඇසුරුම් ගෙන ඒම සපුරා තහනම් කර ඇත.
11. ආපනශාලා වෙත සියළුම බෑග්, ගමන් මලු සහ ඇසුරුම් ගෙන ඒම අවම කිරීමට සිසුන්ට දැඩි ලෙස අවවාද කර ඇත.
12. ශිෂ්‍යයින්ට උදෑසන 6 සිට 7 දක්වා කාලය හැර සෙසු වේලාවන්හි ආයතනවලට පැමිණීමට ඉඩ නොලැබේ. (බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව)